## තාර්කික එකඟතාවයන්ට අනුව **Format** කිරීම

ඔබ Format Cell පහසුකම පිලිබඳ දන්නවා ඇතැයි සිතමි. නමුත් ඊට වඩා ප්‍රයෝජනවත් අයුරින් Format කිරීමට පහසුකමක් Excel සතුය, එය Conditional Formatting ලෙස හඳුන්වනු ලබයි.

මෙහිදී අප සටහන් කළ දත්ත යම් කිසි තර්කයකට එකඟ කළ හැකි අතර තාර්කිකව දත්ත වෙනස් ස්වරූපයන්ගෙන් දැක්විය හැකිය. උදාහරණයක් ලෙස අප විසින් සේවකයන්ගේ මාසික වැටුප් වලින් රු 5000 ත් 8000 අතර වැටුප් සටහන් තබන Cell රතු පැහැයෙන් දර්ශනය විය යුතු යැයි සිතමු, වර්ෂාව මිලිමීටර් 100 ට වඩා ලැබුණු අවස්ථා නිල්පැහැයෙන් දැක්වීම වැනි ක්‍රියාවක් සඳහා අපට Conditional Formatting පහසුකම භාවිතයෙන් කළ හැකිය. මෙවැනි විටක අපට Conditional Formatting පහසුකම ආදේශ කොට ගැනීමට අවශ්‍ය Cell සියල්ල තෝරාගැනීමෙන් අනතුරුව මෙහි ඇති පහසුකම් භාවිතා කළ හැකිය.

## **Conditional Formatting** කවුළුව ලබාගැනීම හා භාවිතා කිරීම

Home Tab හී ඇති Styles යන Icon එක තේරීමෙන් පසුව Conditional Formatting යන විධානය තෝරාගැනීමෙන් මීලඟ රූපයේ

දැක්වෙන ආකාරයේ Tool රාශියක් ඔබට ලැබෙනු ඇත. මින් Manage Rules... යන්න තෝරාගැනීමෙන් මීලග පිටුවෙහි දෙවන රූපයේ දැක්වෙන කවුළුව ඔබ වෙත ලැබෙනු ඇත.






මෙම කවුළුවෙන් New Rule.. යන බොත්තම තේරූ පසුව මීලග රූපයේ දැක්වෙන කවුළුව ඔබට ලබාගත හැකිය.



මෙහි ඉහළ කොටසින් Format only cells that contain යන්න තෝරාගැනීමෙන් පසුව ඉහත උදාහරණය පරිදි රු 5000 හා 8000 අතර අගයන් රතු පැහැයෙන් දර්ශනය කිරීමට අපේක්ෂා කරන බව දැක්වීමට Format only cells with: යන කොටසින් Between යන්න තෝරාගෙන පසුව දැක්වෙන කොටස් දෙකෙහි 5000 හා 8000 සටහන් කළ හැකිය. පසුව මෙහි ඇති Format... යන බොත්තම තේරිය හැකිය. එවිට පහත කවුළුව ලැබෙන අතර මින් අක්ෂර වර්ණගැන්වීම අක්ෂර වර්ගය ප්‍රමාණය වෙනස්කිරීම කළ හැකිය.




මින් Color යන්නෙන් රතු වර්ණය තෝරාගන්න. පසුව ඔබ රුඃ 5000 හා 6000 අතර අගයන් සටහන් කිරීමේදී පමණක් එම අගයන්

රතු පැහැයෙන් වර්ණගැන්වී දර්ශනය වේ. මෙම කවුළුවෙහි ඇති Add යන බොත්තම තෝරාගැනීමෙන් තර්කණයන් එකට වඩා වැඩි සංඛ්‍යාවක් එක් කළ හැකිය. උදාහරණයක් ලෙස රුː 6000ට වැඩිවන අගයන් කොල පැහැයෙන් දක්වීම අපට එක් කළ හැකිය. මෙය ප්‍රයෝගිකව යොදාගෙන මෙහි ඇති පහසුකම් ඔබම අවබෝධ කොට ගන්න.

මෙම 

යටතේ ඇති Manage Rules... යන්න තෝරා ගැනීමෙන් ඉහත උගත් පරිදි අපට තාර්කිකව අපට අවශ්‍ය Format එකක් ආදේශ කරගැනීමේ හැකියාව ඇති අතරම, ඉතා පහසුවෙන් Data Bars, Color Scales, Icon Sets යන Format ක්‍රම තෝරාගත් පසුව එම Cell වල ස්වරූපය වෙනස්ව දර්ශනය කරගත හැකිය. මෙහිදී Cell හී ඇතුලත් කොට ඇති අගයන් පදනම් කොටගෙන විවිධවූ Format ක්‍රම ආදේශ වේ. පහත රූපයේ Cell හී අගයන් සටහන් කොට ඇතිවිට මෙම ක්‍රම තුනෙන් Format කල පසුව දර්ශනය වන ආකාරය පෙන්වා ඇත.




සාමාන්‍යයෙන් ඉහත ක්‍රමතුනෙහිම 

නමින් කොටසක් ඇති අතර මෙය තෝරාගත් පසුව ඒ යටතේ පහසුකම් රාශියක් දැකගත හැකිවන අතර මෙම පහසුකම් ප්‍රායෝගිකව භාවිතා කොට අවබෝධ කොටගන්න.